# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2362/67 - 2023 දෙසැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2023.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 19/1978 (VI)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 61 වන වගන්තිය යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා විමසා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 61 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, 1979 ජූලි මස 2 වැනි දින අංක 43/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, කලින් කල සංශෝධිත නියෝග, ඒ නියෝගයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි *I වන තීරයේ* දැක්වෙන "කොළඹ අධිකරණ කලාපයෙහි පවත්වනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය" යන සටහනට අනුරූපව එහි *II වන තීරයේ* දැක්වෙන -

(අ) 1 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"1. ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක දී සිදු කරන ලද 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ යම් අධිකරණයක් නිශ්චිතව නම් කර නොමැති වැරදි සම්බන්ධ සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණා ද ඇතුළුව මහාධිකරණය විසින් විභාග කළ යුතු බවට නිශ්චිතව දක්වා ඇති, ඒ පනතේ II වන, III වන සහ IV වන කොටස් යටතේ වන වැරදි සම්බන්ධ සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණා.";


1A - G 41022 — 31 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) 4 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"4. ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක දී සිදු කරන ලද, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය යටතේ වූ වැරදි සම්බන්ධ වූ සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණා."; සහ

(2) එහි *I වන තීරයේ* දැක්වෙන "කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය" යන අයිතමයට අනුරූපව *II වන තීරයේ* දැක්වෙන -

(අ) 3 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"3. මහෙස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කළ යුතු බවට නිශ්චිතව දක්වා ඇති, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ II වන III වන සහ IV වන කොටස් යටතේ වන වැරදි සම්බන්ධ සියලු නඩු පැවරීම්, නඩු කටයුතු හෝ කාරණා."; සහ

(ආ) 4 වන, 5 වන සහ 6 වන සටහන් ඉවත් කිරීමෙන්.

EOG 12 - 0224

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.